# දැන්වීමයි

## නේවාසිකාගාර පහසුකම් ලබාදීම

## ප්‍රථම වසර - 2024

නේවාසිකාගාර පහසුකම් ලබාදීමේදී පවතින සීමිත ඉඩකඩ මත තෝරාගත් පිරිසකට පමණක් නේවාසිකාගාර පහසුකම් ලබාදෙන අතර එහිදී පහත මූලික නිර්ණායකයන් ද සැලකිල්ලට ගනු ලැබේ.

- විවාහක සිසුන් සඳහා නේවාසිකාගාර පහසුකම් ලබාදෙනු නොලැබේ.
- කිලෝමීටර 25 ට අඩු දුර සහිත සිසුන් සඳහා නේවාසිකාගාර පහසුකම් ලබාදෙනු නොලැබේ.

පීඨයන් සඳහා ලියාපදිංචි වන ප්‍රථම වසර නවක සිසුන්ගෙන් නේවාසිකාගාර පහසුකම් සඳහා තේරී පත් වූ සිසුන්ගේ නාම ලේඛනය අධ්‍යයන කටයුතු ආරම්භ කිරීමට පෙර ශිෂ්‍ය සුබසාධක අංශ වෙබ් අඩවියේ ( welfare.sjp.ac.lk) පළ කරන අතර එම නාම ලේඛනයේ නම් සඳහන් සිසුන් පමණක් අදාල නේවාසිකාගාරයේ ලියාපදිංචි වීමේදී පහත සඳහන් ලේඛණ උපශාලාධිපති වෙත ඉදිරිපත් කල යුතු බව දන්වා සිටිමි.

I. නේවාසිකාගාර ගාස්තු ලෙස රු.2000/- ක මුදලක් බැංකුවට ගෙවා ලබා ගත් බැංකු රිසිට් පතේ පිටපත (නේවාසිකාගාර ගාස්තු ගෙවීමට අදාල වවුචර්පත් ශිෂ්‍ය සුබසාධක අංශ වෙබ් අඩවියෙන් (welfare.sjp.ac.lk) ලබාගත හැකිය).නේවාසික පහසුකම් හිමි නේවාසිකාගාර ගාස්තු නොගෙවන සිසුන්ට නේවාසික පහසුකම් හිමි නොවන අතර අදාල නේවාසිකාගාර ගාස්තු ගෙවීමෙන් පසු පහසුකම ලබාගත හැක.

II. (2.5cmx3.5cm) ප්‍රමාණයේ (මුද්දර ප්‍රමාණයේ) ඡායාරූප 2ක් (ඡායාරූප පිටුපස නම සහ ලියාපදිංචි අංකය සඳහන් කරන්න)

III. පුරවන ලද ශිෂ්‍ය තොරතුරු පත්‍රිකාව (ශිෂ්‍ය සුභසාධක අංශ වෙබ් අඩවියෙන් බාගත කරගත හැකිය)

IV. නේවාසික පහසුකම් ලබාගැනීමට පැමිණීමේදී කොට්ටයක්,ඇඳ ඇතිරිල්ලක්,මදුරු දැලක්,පිගානක්,කෝප්පයක් ආදී භාණ්ඩ රැගෙන ඒම ඔබගේ අවශ්‍යතා ඉටුකරගැනීමේදී ප්‍රයෝජනවත් විය හැකිය.

නියෝජ්‍ය ලේඛකාධිකාරී
ශිෂ්‍ය සුභසාධක අංශය
2024.01.16

නියෝජ්‍ය ලේඛකාධිකාරී
ශිෂ්‍ය සුභසාධක අංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
ගංගොඩවිල - නුගේගොඩ.